(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 3(2).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2016 මැයි මස 23 වැනි සඳුදා**

---

## 2016 ජූනි මස 07 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## 2016 ජූනි මස 10 වැනි සිකුරාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.177/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— හජ් වන්දනා පනතක් හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ සිට වාර්ෂිකව හජ් වන්දනාවේ යෙදෙන බැතිමතුන් විසින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කර ගැනීමටත්, ඒ පිළිබඳ ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කොට නීතිමය ප්‍රතිපාදන සකස් කිරීමටත්, රජය මඟින් "හජ් වන්දනා පනතක්" හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.178/'16

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— යුද්ධය නිසා දිවි අහිමි වූ ජනතාව සිහි කිරීම සඳහා අනුස්මරණ ස්මාරකයක් තැනීම සහ සිහිපත් කිරීම සඳහා පොදු දිනයක් වෙන් කිරීම,— දශක ගණනාවක සිට උතුරු පළාතේ පැවති යුදමය වාතාවරණය තුරන් වී සාමකාමී ජීවන රටාවකට ජනතාව දැන් අවතීර්ණ වී සිටින අතර පසුගිය කාලයේ පැවති අසාමාන්‍ය තත්ත්වයන් නිසා ද, යුදමය වාතාවරණය හේතුවෙන් ද, ඝාතනයට ලක්වූ සියලු ජාති, ආගම් හා සමාජවලට අයත්, සියලුම භාෂාවන් කතාකරන ජනතාව, ශ්‍රී ලාංකිකයින් ලෙස සිහිපත් කරමින්, එම ජනතාව මව්බිම වෙනුවෙන් ද, ඔවුන් කළ පරිත්‍යාගයන්වලට ගෞරව කිරීම සඳහා ද, උතුරු පළාතේ ඕමන්තේ ප්‍රදේශය තුළ සුදුසු ස්ථානයක "අනුස්මරණ ස්මාරකයක්" තැනීමට ද, එම යුදමය තත්ත්වය නිසා දිවි අහිමි වූ සියලුම ජාති, ආගම් හා භාෂාවන් කථා කරන ජනතාව සිහිගැන්වීම සඳහා සුදුසු දිනයක් නම් කොට සෑම වසරක් පාසාම එම දිනය සැමරීමට ද රජය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2016 ජූනි මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2015.08.18 දින ගාල්ල වරාය පොලිසිය කරන ලද පරීක්ෂා කිරීමක දී වරායේ ගාල් කර තිබූ "මහනුවර" නමැති නෞකාව තුළත්, ශ්‍රී ලංකා දක්ෂිණ නෞකා කඳවුරේ සහ එහි සේවා වනිතා ඒකකය සතු ගොඩනැගිල්ලක අවි සහ උණ්ඩ තිබී හමු වූ බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලිසිය මඟින් අනාවරණය කරගත් අවි සහ උණ්ඩවල නීත්‍යානුකූල අයිතිය කවර පුද්ගලයෙකු හෝ ආයතනයක් සතු වන්නේද;

(ii) එම අවි ආයුධ පුද්ගලයෙකුට හෝ ආයතනයකට කවර පනතක් යටතේ පවරා තිබේද;

(iii) එසේ නම්, ඊට බලය ලබා දුන් බලධරයා කවුරුන්ද;

(iv) එම ආයුධ නිෂ්පාදිත රට, වර්ෂය සහ බලපත්‍රය කවරේද;

(v) ආයුධ මිලදී ගත් ක්‍රමය සහ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාවෙන අවි ගබඩාව වරාය පරිශ්‍රයේ පවත්වාගෙන යාමට අවසර තිබේද;

(ii) ඊට අවසර ලබා දී ඇති බලධරයා කවුරුන්ද;

(iii) ඒ වෙනුවෙන් ඇවන්ට්ගාර්ඩ් සමාගම මුදල් ගෙවන්නේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මේ පිළිබඳව නීතිපතිවරයාගේ නිගමනයන් විෂයභාර අමාත්‍යවරයා වශයෙන් පිළිගන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කමිටුවක් පත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

102/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිල්වලා ගඟේ හා ගිං ගඟේ ජලය මහ හම්බන්තොට සංවර්ධන කලාපයට ගෙන යෑමේ ව්‍යාපෘතියට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයට ගෙන යෑමට බලාපොරොත්තු වන ජල ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ සැලසුම ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ගාල්ල හා මාතර දිස්ත්‍රික්වල පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ පාරිසරික වාර්තාවක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(v) මෙම ව්‍යාපෘතියෙන් නිල්වලා ගඟට කරදිය මිශ්‍රවීමේ අවදානම පාලනයට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

333/’15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) විශ්වවිද්‍යාලවල අනධ්‍යයන උප ශාලාධිපතිවරුන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලබන අනුමත නිවාඩු ප්‍රමාණයන් කවරේද;

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 912/1ට අනුව දින 90ක්ව පැවති වාර්ෂික නිවාඩු ප්‍රමාණය දින 45 දක්වා අඩු කර තිබේද;

(iii) එසේ නම්, එයට හේතුව කවරේද;

(iv) නැවත අංක 04/2003 චක්‍රලේඛය අනුව සාමාන්‍ය රජයේ නිවාඩු, සෙනසුරාදා, ඉරිදා, සහ පෝය දිනද ඇතුළත්ව දින 90ක් දක්වා එම නිවාඩු ප්‍රමාණය වෙනස්කර තිබේද;

(v) එසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ සේවකයන්ට හිමි නිවාඩුද ඔවුන්ට හිමි දින 90 තුළට ඇතුළත්කර සැලකීමෙන් එම සේවකයන්ට, වෙනත් සාමාන්‍ය සේවකයින්ට ලැබෙන වරප්‍රසාදයක් අහිමි කර ඇති බව පිළිගන්නේද;

(ii) සාමාන්‍ය රජයේ සේවකයින්ට හිමි නිවාඩු වරප්‍රසාද කප්පාදු නොකර, විශ්වවිද්‍යාල අනධ්‍යයන උප ශාලාධිපතිවරුන් සඳහා නිවාඩු ලබාදීමේ පිළිගත් ක්‍රමවේදයක් සකස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

351/’15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව මඟින් ට්‍රයිස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට්ස් (පෞද්.) සමාගමට රුපියල් මිලියන 530ක ණය මුදලක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ කවර පදනමක් යටතේද;

(iii) එම ණය මුදල ලබාදීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

(v) නොඑසේ නම්, එම මුදල එම සමාගමෙන් අයකර ගැනීමට ගත් පියවර කවරේද;

(vi) මේ වනවිට ගෙවා ඇති මුදල කොපමණද;

(vii) නොගෙවූ මුදල අය කර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය ජනාධිපතිවරණ සමයේ දී ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් රුපියල් ලක්ෂ 700ක මුදලක් පිළිගත් ක්‍රමවේදයකින් තොරව ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම මුදල අයකර ගැනීම සඳහා ක්‍රියා පිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියා පිළිවෙළ කවරේද;

(iv) එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

392/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014 වසරේදී ලංකාවට ආනයනය කළ ඉන්ධන ලෙස හීලියම්, හයිඩ්‍රජන් සහ විදුලිය සම්පූර්ණයෙන්ම භාවිතා කරන වාහන සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හීලියම් පමණක් භාවිතා කරන වාහන වාණිජ මට්ටමින් වෙළඳපොළට හඳුන්වා දී ඇති සමාගම් සහ එකී වාහන වෙළඳපොළට හඳුන්වා දුන් වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) හයිඩ්‍රජන් පමණක් භාවිතා කරන වාහන වාණිජ මට්ටමින් වෙළඳපොළට හඳුන්වා දී ඇති සමාගම් සහ එකී වාහන වෙළඳපොළට හඳුන්වා දුන් වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) හයිඩ්‍රජන් සහ හීලියම් පමණක් භාවිතා කරන වාහනවල අවම මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

408/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) අංක S/C 2008 සහ 2008.10.24 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව අනුව, භාණ්ඩාගාර විවිධ වියදම් වැය අයිතම (TMV) මඟින් ලබා දෙනු ලබන විශේෂිත ප්‍රතිපාදන, අදාළ අමාත්‍යාංශය සඳහා වන අතිරේක ප්‍රතිපාදනයන් වේ. 2008 විසර්ජන පනතේ 6(1) වගන්තිය ඒ අනුව සංශෝධනය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත කරුණු අනුව 2015 වර්ෂය තුළදී අතිරේක ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශ කවරේද;

(ii) අමතර ප්‍රතිපාදන ලබාදුන් අරමුණු එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එසේ ලබාදුන් අතිරේක ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විශේෂ වියදම් ඒකක වන අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරු යන අයිතමයන් සඳහා 2015 වර්ෂයේදී අතිරේක ප්‍රතිපාදනයන් ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

422/'16

ගරු විජිත හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනාධිපතිවරණයේදී රජයේ සේවකයන්ට ලබාදීමට පොරොන්දු වූ රු.10,000/=ක මුදලින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2015 අනුව රාජ්‍ය, සංස්ථා, මණ්ඩල, පළාත් ආයතන හා රජය සතු සමාගම්වලට ලබාදුන් රු.8000/=ක මුදල රාජ්‍ය ව්‍යාපෘතිවල කාර්ය මණ්ඩලවලට ලැබී නොමැති බවත්;

(ii) පෙර වැටුප් වැඩිවීම්වලදී ව්‍යාපෘතිවල සේවකයින්ටද එම වැටුප් වැඩිවීම් ලබාදීමට මුදල් අමාත්‍යාංශය කටයුතු කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) අනුව වැටුප් වැඩිවීම ලබා දී මාස 10ක කාලයක් ගතවී ඇතත්, ව්‍යාපෘති කාර්ය මණ්ඩලවලට එය ලබා නොදීමට බලපෑ හේතු කවරේද;

(ii) එම වැටුප් වැඩිවීම ව්‍යාපෘති සේවකයින්හට ලබාදීම සඳහා දැනට ගෙන ඇති පියවර කවරේද;

(iii) අදාළ වැටුප් වැඩිවීම රාජ්‍ය ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද;

(iv) දැනට වසර 02ක කාලයක් පුරා අත්හිටුවා ඇති ව්‍යාපෘතිවලට අදාළව සකස් කොට ඇති යෝජිත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

476/'16

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යහපාලන රජය ආරම්භ වූ දින සිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඇතැම් ඩිපෝවල සේවය කරන විවිධ තනතුරු දරන නිලධාරීන් හා සේවකයින් නොයෙකුත් අසාධාරණකම්, කරදර හා පීඩාවන්ට ලක්වී ඇති බවත්;

(ii) සමහර සේවකයින් දරන ලද තනතුරුවලින් ඉවත්කර ඇති බවත්;

(iii) එවැනි සේවකයින් අදාළ නොවන වෙනත් සේවාවල යොදවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රියාවලිය යහපාලන රජයේ ප්‍රතිපත්තිවලට පටහැනි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, අසාධාරණයට, කරදර සහ පීඩාවන්ට ලක් වූ එවැනි සේවකයින්ට සාධාරණය ඉටු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

507/'16

ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහත සඳහන් ලිපිනයන්හි පදිංචිකරුවන් ඉතා අඩු ආදායම්ලාභී ගොවි පවුල්වලට අයත් සාමාජිකයින් බව එතුමා පිළිගන්නෙහිද?

| | | |
|---|---|---|
| (i) | කේ. ජී. චන්ද්‍රසේන මහතා | 18, රිදීඇල |
| (ii) | එච්. එම්. ආරියදාස මහතා | 12, මහවැලි නිවාස අසල, චන්දනගම |
| (iii) | එම්. එම්. කේ. හේමමාලි මිය | 128/1, තුවාරගල |
| (iv) | කේ. එම්. එම්. මනෝ රංජනී මිය | බඹරවාන |
| (v) | ඒ. ඉන්ද්‍රානි මල්කාන්ති මිය | බඹරවාන |
| (vi) | කේ. එම්. කරුණාරත්න මිය | 209, රන්හෙලගම |
| (vii) | යූ. ජී. සුභාෂිණී මිය | 299/2, තුවාරගල |

(ආ) එසේ නම්, පාසැල් අධ්‍යාපනය හදාරන දරුවන් සමඟ නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ ජීවත්වන ඔවුන්ගේ පැල්පත් නිවාස ප්‍රතිසංස්කරණය කරගැනීම සඳහා නිවාස ආධාර ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

549/’16

ගරු විමල් වීරවංශ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය රජය වයස අවුරුදු 60ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රුපියල් මිලියන 01ක් දක්වා වූ ස්ථාවර තැන්පතු සඳහා සියයට 15ක පොලී අනුපාතයක් ලබා දුන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2016 වසරේ සිට එම සහනය ලබන වයස් සීමාව අවුරුදු 60 සිට 55 දක්වා අඩු කිරීමටත්;

(ii) තැන්පතු මුදල රුපියල් මිලියන 1.5 දක්වා වැඩි කිරීමටත්;

(iii) මෙම පහසුකම සපයන බලපත්‍රලාභී සමාගම් සඳහා සියයට 1.5ක පොලී සහනාධාරයක් ලබාදීමටත්;

(iv) ඒ සඳහා රුපියල් මිලියන 1,500ක මුදලක් වෙන් කිරීමටත්;

මෙවර අයවැයෙන් යෝජනා කළ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඊට අදාළ චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශය විසින් මේ වන විට නිකුත් කර තිබේද;

(ii) එසේ නම්, එකී සහනය ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම පහසුකම් සපයන බලපත්‍රලාභී මූල්‍ය සමාගම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

559/’16

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයෙහි පොදු ක්‍රීඩාපිටියක් ඉදිකිරීමට යෝජනා කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා මුදල් වෙන්කර තිබේද;

(iii) ඒ සඳහා වෙන්කළ මුදල කවරේද;

(iv) ක්‍රීඩාපිටියේ ඉදිකිරීම් ඇරඹීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(v) මිළ ගණන් කැඳවීම නිසි ක්‍රමවේදයක් අනුව සිදුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුදල් වෙන් කිරීමේදී අක්‍රමිකතා සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ලබා දෙන විසඳුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

565/’16

ගරු විදුර වික්‍රමනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ, රාජකීය විද්‍යාලෙන් පළමු වරට අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිට, ගණිතය විෂය අසමත්ව 2016 අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටින සිසුන් 30කට ආසන්න සංඛ්‍යාවක් චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව විදුහල්පතිතුමා විසින් විද්‍යාලෙන් අස්කර ඇති බවත්;

(ii) ඇතැම් සිසුන් වෙත නිකුත් කරන ලද චරිත සහතික අවලංගු කිරීම වැනි දරුවන් මානසිකව පහතට ඇද දැමීමේ කටයුතු සිදු කිරීමෙන් එම සිසුන් සහ දෙමාපියන් මහත් අපහසුතාවයට ලක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගය පැවැත්වීමට තිබෙන ඉදිරි මාස හයකට ආසන්න කාලපරිච්ඡේදය විභාගයට වඩාත් සාර්ථකව මුහුණ දීමට සිසුන් සූදානම් කරන කාලය වන බැවින් එම සිසුන්ට විදුහලේ අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව අහිමිකිරීම නිදහස් අධ්‍යාපන පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව අහිමි කිරීමක් වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ අනාගතය භාර ගැනීමට සිටින සිසුන් මානසිකව පහතට ඇද දැමීම විදුහල්පතිවරයකුගේ යුතුකම වේද;

(ii) විදුහල්පතිවරයාගේ මෙම ක්‍රියාකලාපය හේතුවෙන් පැන නැගී ඇති ගැටලුව විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

571/'16

ගරු සෙය්යිද් අලී සාහිර් මවුලානා මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කොක්කට්ටිචෝලේ, වෙල්ලාවේලි, කිරාන්, වෙන්කලඩි, වාකරේ, වච්නතිව් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යුද්ධමය වාතාවරණය අවසන්වීමත් සමඟ නැවත පදිංචි වූ ජනතාව විසින් ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ ඉදිකරගත් පැල්පත් නිවාස ගණනාවක් වන අලි ප්‍රහාර නිසා විනාශ වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වන අලින් විසින් විනාශ කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) වන අලි ප්‍රහාර නිසා මියගිය සහ ශාරීරික තුවාල ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වන අලි කඩා වැදීම නිසා කුඹුරු ඇතුළු හේන් ගොවිතැන් විනාශ වීමෙන් රැකියා අහිමිවූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නිවාස අහිමිවූවන්ට නිවාස ඉදිකර ගැනීම සඳහාත්, මියගිය, ශාරීරිකව තුවාල ලැබූ සහ රැකියා අහිමිවූ පුද්ගලයින්ට වන්දි ලබාදීම සඳහාත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, මියගිය සහ විපතට පත්වූ පුද්ගලයින් අතරින් වන්දි ලබාදී ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, අනුව ප්‍රදානය කර ඇති වන්දි මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

590/'16

ගරු ලකී ජයවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවතින මුළු සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන අතරින් රජයේ ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව සහ කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබාගත් ගොඩනැඟිලි සඳහා කුලී ගෙවීමට සතොස මඟින් වාර්ෂිකව කොපමණ මුදලක් වැය කරන්නේද;

(ii) කුලියට ලබාගත් ගොඩනැඟිලි පිහිටා තිබෙන ස්ථාන කවරේද; එම ස්ථානවල හිමිකරුවන් කවුරුන්ද; ඔවුන්ට මාසිකව ගෙවන කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ස්ථානවල දැනට පවත්වාගෙන යන සහ වසා දමා ඇති සතොස ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සතොස වෙළඳ ආයතන පිහිටුවීමට කුලී පදනම මත ගොඩනැඟිලි ලබා ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

103/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ කැනඩාවේදී හා ඇමරිකාවේදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණවලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ කැනඩාවේදී හා ඇමරිකාවේදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල්හිදී ඔවුන් කළ රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2016 ජූනි මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

104/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ ඕස්ට්‍රේලියාවේදී හා ජපානයේදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණවලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ ඕස්ට්‍රේලියාවේදී හා ජපානයේදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල ඔවුන් කළ රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ)නොඑසේ නම්, ඒ මන්ද?

375/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 සිට 2015 දක්වා වසරවල එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට (General Assembly) සහභාගී වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්වල,

(i) ප්‍රධානත්වය දැරුවේ කවුරුන්ද;

(ii) නියෝජිතයින් සංඛ්‍යාව කවරේද;

(iii) ඒ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිටියේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

(iv) විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) වැය කළ මුළු මුදල කොපමණද;

(vi) එම වියදම ගුවන් ගමන්, හෝටල් හා නවාතැන් වියදම් ලෙස එක් එක් ශීර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

428/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013, 2014 සහ 2015 වර්ෂයන්හිදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගත් භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමේදී නව මුදල් නෝට්ටු මුද්‍රණය සංසරණයට එක් වීමෙන් උද්ධමනය ඉහළ යන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

475/'16

ගරු කනක හේරත් මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අපනයනය කරන ලද කරාබුනැටි, කුරුඳු, ගම්මිරිස්, සාදික්කා හා කරදමුංගු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් එක් එක් ද්‍රව්‍ය සඳහා ලැබුණු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2014 වර්ෂයට සාපේක්ෂව, 2015 වර්ෂයේදී ලැබූ ආදායමෙහි අඩුවීමක් හෝ වැඩිවීමක් දක්නට තිබේද;

(iv) එසේ නම්, ඒවායේ නිෂ්පාදනය වැඩිකිරීමට රජය ගෙන ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

508/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ අංක R/0682/T/036 යටතේ ලියාපදිංචි කරන ලද ත්‍රිකුණාමලය, N.C. වීදියේ, අංක 154 දරන ස්ථානයේ පිහිටි මුහියිද්දීන් ජුම්ආ පල්ලියට අයත්, නිශ්චල දේපළ (ඉඩම්, නිවාස හා වෙළඳසැල්) සංඛ්‍යාව කොපමණද;

(ii) එම දේපළ පිහිටා තිබෙන එක් එක් ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(iii) එක් එක් දේපළවලින් මාසිකව ලබන ආදායම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වකුෆ් දේපළවලට අයත් ඔප්පුවල සඳහන් නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වකුෆ් දේපළ පරිහරණයේදී දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබා තිබේද;

(ii) එම දේපළ අතරින්, සමහර දේපළ සින්නක්කර ඔප්පු මඟින් කිසියම් පුද්ගලයින්ගේ නමට පවරා තිබේද;

(iii) එසේ නම්, මේ පිළිබඳව ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

561/'16

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පලාලි ප්‍රදේශයේ ගුරු අභ්‍යාස විද්‍යාලයක් පිහිටා තිබෙන බව එතුමා දන්නේද;

(ii) එම ගුරු අභ්‍යාස විද්‍යාලය ක්‍රියාත්මකවීම සැලසුම් සහගත ලෙස වළක්වා තිබේද;

(iii) මෙම ගුරු අභ්‍යාස විද්‍යාලය පිහිටි ඉඩම අත්පත් කරගෙන සිටින්නේ කවුරුන්ද;

(iv) එම ඉඩම නිදහස් කරගෙන ගුරු අභ්‍යාස විද්‍යාලයට ලබාදීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම අභ්‍යාස විද්‍යාලය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ දක්වා ගුරු පුහුණුව අවසන් කර පිට වූ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය කාලයේ මෙම අභ්‍යාස විද්‍යාලයේ පවත්වනු ලැබූ පාඨමාලා කවරේද;

(iv) මේ වනවිට පවත්වනු ලබන පාඨමාලා කවරේද;

(v)එම ගුරු අභ්‍යාස විද්‍යාලය යළි ක්‍රියාත්මක කිරීමට ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

567/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අක්මීමන, අමල්ගම රජයට අයත් හිස් ඉඩම් කැබලි 174 ක් සඳහා 2007 වර්ෂයේදී ප්‍රසම්පාදන දැන්වීමක් පලකර තිබුනේද;

(ii) ඉහත සඳහන් ඉඩම් විකිණීමේදී නිවාස සංවර්ධන අධිකාරිය ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව කටයුතු කර තිබේද;

(iii) අක්මීමන, අමල්ගම ඉඩම් කැබලි අංක 21, තෝරාගත් අය සඳහා ලබා දී තිබේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අ(iii) හි සඳහන් ඉඩම් කැබලි බෙදාදීම සඳහා තෝරාගත් පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද; ඔවුන්ගේ නම් කවරේද;

(ii) අ(iii) හි සඳහන් ඉඩම් කැබලි අංක 21ට අයත් මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් සඳහා තෝරාගත් පුද්ගලයින් සඳහා මේ වනතෙක් ඉඩම් ලබා නොදීමට හේතුව කවරේද;

(iv) තෝරාගත් අය සඳහා ඉඩම් ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

573/'16

ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ-නුවර මාර්ගයේ, වීදියවත්ත සිට නිට්ටඹුව දක්වා වූ කොටස පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා කල්එළිය, මස්ජිද් මාවත, අංක 5/1 දරන ස්ථානයේ පදිංචි එම්. ආර්. එම්. මිම්සියාඩ් මහතාට අයත් ගම් 392 කැබලි අංක 164 කොටස රජයට පවරා ගන්නා ලද බවත්;

(ii) එම ඉඩම සඳහා මෙතෙක් වන්දි ප්‍රදානය කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කොළඹ-නුවර ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටි, වාණිජමය ප්‍රදේශය හා සම්බන්ධ එම ඉඩම් කැබැල්ල අඩු වටිනාකමට තක්සේරු කිරීමෙන් අසාධාරණයට ලක් වී සිටින මිම්සියාඩ් මහතාට, වර්තමාන තක්සේරු වටිනාකම සැලකිල්ලට ගෙන වන්දි මුදල් ප්‍රදානය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

592/'16

ගරු ලකී ජයවර්ධන මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත්ව තිබී 1994.12.31 දින සිට මේ දක්වා කාලය තුළ විවිධ පුද්ගලයන්ට සහ ආයතනවලට ලබා දී ඇති මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ලබා දී ඇති පුද්ගලයින් සහ ආයතන; පිහිටි ස්ථාන; ප්‍රමාණයන් සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් ලබාදීමෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ලැබී ඇති මුළු ආදායම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඉඩම්වලින් මේ වනවිට සංවර්ධනය කර හා නොකර ඇති ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දිය හැකි එහෙත් නිසි සංවර්ධනයක් සිදුකර නොමැති ඉඩම් නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

607/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආරක්ෂක හමුදාවල සේවයේ නියුතු විවාහක සාමාජිකයින්ට තුන්වන දරුවෙකු උපත ලැබූ විට මීට පෙර පැවති රජයෙන් ලබා දුන් රුපියල් ලක්ෂයක දීමනාව මේ වනවිටත් ගෙවන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

623/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල මහා නගර සභාව, විසින් සිවිලි පාරේ සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට යෝජිතව තිබූ බවත්;

(ii) පසුව එම ඉඩම නාය යෑම නිසා බැම්ම ඉදිකිරීමට පමණක් රුපියල් මිලියන 4ක මුදලක් වැයකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අ (ii) හි සඳහන් බැම්ම ඉදිකිරීම සඳහා අවසර ලබා දුන් දේශපාලන අධිකාරිත්වය හා නිලධාරීන්ගේ නම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

632/'16

ගරු ජයන්ත සමරවීර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1948 සිට 2015 ජනවාරි 08 දක්වා කාලය තුළ සැකපිට රක්ෂිත බන්ධනාගාරගත කළ හා චෝදනා ඔප්පු වීමෙන් පසු වැරදිකරුවන් ලෙස සිරගත කළ බෞද්ධ භික්ෂූන්වහන්සේලා සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කළ හෝ සිරගත කළ භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට හෝ සිරගත කිරීමට හේතු වූ චෝදනාව හෝ වරද, එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රක්ෂිත බන්ධනාගාරගත කළ හෝ සිරගත කළ භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගතව හෝ සිරගත කර සිටි කාලය එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) 2015.01.08 සිට 2016.03.31 දක්වා කාලය තුළ රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන්වහන්සේලා සංඛ්‍යාව කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන්වහන්සේලාට එල්ල වුණු චෝදනාව එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි කාලය එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

656/'16

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 දින සිට මේ දක්වා කාලය තුළ වත්මන් හා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පළාත් සභා මන්ත්‍රීවරුන්ට සහ ප්‍රාදේශීය සභා නගර සභා සහ මහ නගර සභා මන්ත්‍රීවරුන්ට එරෙහිව විශේෂ විමර්ශන ඒකකයට (SIU) ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (i) පරිදි එම චෝදනාවන්ට ලක් වී ඇති වත්මන් හා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් සහ ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා මන්ත්‍රීවරුන්ගේ නම් සභාගත කරන්නේද;

(iii) විශේෂ විමර්ශන ඒකකය විසින් විමර්ශන අරඹා ඇති වත්මන් හා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් සහ ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම විමර්ශනවල ප්‍රතිඵල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

108/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට පවත්වාගෙන යනු ලබන සිනමාශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) රට තුළ දැනට ක්‍රියාත්මක වන සිනමා මණ්ඩල සංඛ්‍යාව කොපමණද; ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් මණ්ඩලයට අයත් සිනමාශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) චිත්‍රපටය අයත් විය යුතු මණ්ඩලය තීරණය කරන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) චිත්‍රපටයක් ප්‍රදර්ශනය කළ යුතු සිනමාශාලා සංඛ්‍යාව කොපමණද යන්න පිළිබඳ නිශ්චිත අගයක් තිබේද;

(ii) එසේ නම්, එම පිටපත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිශ්චිත සීමා ඉක්මවා යන අවස්ථා තිබේද;

(iv) එසේ නම්, එලෙස නිශ්චිත පිටපත් සංඛ්‍යාව ඉක්මවා චිත්‍රපටයක් ප්‍රදර්ශනය කළ හැකි ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එක් නිෂ්පාදකයෙකුට වැඩි අවස්ථාවක් ලබාදීම නිසා තවත් නිෂ්පාදකයෙකුට අසාධාරණයක් සිදු වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, සියලු නිෂ්පාදකයින්ට සාධාරණ පිටපත් සංඛ්‍යාවක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබාදීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

357/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සරණාගතයින් ලෙස විදේශ රටවල පුරවැසිභාවය අයදුම්කර සිටින ශ්‍රී ලාංකිකයින්, ශ්‍රී ලාංකිකයින් ලෙස පිළිගන්නේද;

(ii) එසේ නම්, එවැනි අය සඳහා තානාපති කාර්යාලවල සේවය ලබා නොදිය යුතු බවට චක්‍රලේඛයක් තිබේද;

(iii) එම චක්‍රලේඛය ඉවත් කිරීමට බලාපොරොත්තු වන්නේද;

(iv) එසේ නම්, චක්‍රලේඛය ඉවත් කිරීමට බලාපොරොත්තුවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2016 ජූනි මස 24 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

111/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ පොම්පකැලේ රක්ෂිතයේ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එහි ඇති ඒකදේශික ශාක මොනවාද;

(iii) පොම්පකැලේ රක්ෂිතයේ වාසය කරන ඒකදේශික සතුන් වර්ග කවරේද;

(iv) මෙම වනාන්තරය රක්ෂිතයක් ලෙස නම් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014.04.14 දිනට පසු දිනක පොම්පකැලේ රක්ෂිතයේ අක්කරයකට වැඩි ප්‍රමාණයක් එළිකොට ඇති බවත්;

(ii) එම එළිකිරීම සිදු කර ඇත්තේ රක්ෂිතයේ ජෛවීය වැදගත්කමක් ඇති ඉහළ කොටසේ බවත්;

(iii) එම නිසා විශාල පරිසර හානියක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) පොම්පකැලේ රක්ෂිතයේ මෙම විනාශය සිදු කර ඇත්තේ කවුරුන් විසින්ද;

(ii) ඒ කුමන පරමාර්ථයක් සඳහාද;

(iii) මෙම වන විනාශයට අවසර ලබා දුන් නිලධාරීන් වේ නම්, ඔවුන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා තනතුරු කවරේද;

(iv) පොම්පකැලේ රක්ෂිතයේ විනාශය නැවැත්වීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

473/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1998 සිට කරාපිටිය ශික්ෂණ රෝහලේ දිනකට හෘද සැත්කම් 15-20 අතර සංඛ්‍යාවක් සිදු කළ බවත්;

(ii) 2010 සිට දිනකට සිදු කරන හෘද සැත්කම් සංඛ්‍යාව 2 දක්වා පහත වැටී ඇති බවත් ;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම තත්ත්වය මත රෝගීන්ට දිගු කාලයක් පොරොත්තු ලේඛනයේ රැඳී සිටීමට සිදුවන බවත්;

(ii) ඒ හේතුවෙන් රෝගීන් විශාල සංඛ්‍යාවක් මියයන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) දිනකට සිදු කරනු ලබන හෘද සැත්කම් සංඛ්‍යාව පහත වැටීමට හේතු කවරේද;

(ii) දිනකට සිදු කරනු ලබන හෘද සැත්කම් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා පියවර ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

477/'16

ගරු කනක හේරත් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යාලය මඟින් දැනට පාරිභෝගික ජල සේවා සම්බන්ධතා සහ ජල නළ සේවා දීර්ඝ නොකරන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iii) මේ හේතුවෙන් මාවනැල්ල ප්‍රදේශයේ ජලය ලබා ගැනීමට අපේක්ෂිත ජනතාව දුෂ්කරතාවයට පත්වන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, දුෂ්කරතාවයට පත් ජනතාවට ජල සම්බන්ධතා ලබාදීමට හැකි කාලවකවානුව සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

509/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සුනාමි ව්‍යසනය නිසා දිවයිනේ විවිධ පළාත්වල නිවාස හා දේපළ අහිමි වූ පවුල් ගණනාවක් මේ වනවිටත් අසරණභාවයෙන් පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නිවාස අහිමිවී සිටින පුද්ගලයින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගෙන ඔවුන්ට ස්ථිර නිවාස ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

(ii) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ඒකාබද්ධව එම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

562/'16

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය කාර්මික විද්‍යාලයේ සිදුවූ මුදල් අක්‍රමිකතාව පිළිබඳව එතුමා දන්නේද;

(ii) එසේ නම්, මෙතෙක් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(iii) එම කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂවරයා විසින් සිදුකළ මුදල් වංචාව තහවුරු වීමෙන් පසු ඔහුට ස්ථාන මාරුවක් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම ස්ථාන මාරුව මෙතෙක් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(v) අදාළ ස්ථාන මාරුව අත්හිටුවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපනය කාර්මික විද්‍යාලයේ වෙනත් ශාඛා එම දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබේද;

(ii) නොඑසේ නම්, එම දිස්ත්‍රික්කයේ ජීවත්වෙන 650,000 ක ජනතාවට මෙම කාර්මික විදුහල ප්‍රමාණවත්ද;

(iii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

574/'16

ගරු සෙය්යිද් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව අධ්‍යාපන කලාපයට අයත්, අ/බමුණුගම මුස්ලිම් විදුහලේ විදුහල්පති ධූරය දරමින් සිටි ඒ. එච්. සමුන් මහතා, යම් විනය නියෝගයක් මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:17 වගන්තිය අනුව (යොමු අංක උමැප/ අදෙ/07/2/001) විශ්‍රාම ගැන්වීම සඳහා නිර්දේශ කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

(iii) ඒ අනුව, ඔහුගේ විශ්‍රාම පාරිතෝෂික මුදල සහ විශ්‍රාම වැටුප ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

593/'16

ගරු ලකී ජයවර්ධන මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුරගමන් සේවා දුම්රියවල පවත්වාගෙන ගිය භෝජනාගාර සේවය මේ වනවිට ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(ii) භෝජනාගාර වසා දැමීම නිසා දුර ගමන් සේවා දුම්රියවල ගමන් ගන්නා මගීන් අපහසුතාවයට පත්වන බවත්, භෝජනාගාර මඟින් රජයට හිමිවූ ආදායම අහිමි වී ඇති බවත් පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) භෝජනාගාර සේවය නැවත ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(ii) වසා දමා ඇති භෝජනාගාර සේවය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

616/'16

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්පානය කිරීමෙන් පිළිකා, අංශභාග සහ වකුගඩු රෝග බහුල වශයෙන් ඇතිවන බවත්;

(ii) එය රටේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට සහ ආර්ථිකයට හානිකර බවත්;

(iii) දුම්කොළවලින් රටට ලැබෙන ආදායමට වඩා ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීම ආර්ථිකයට හානියක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දුම්බීම සම්පූර්ණයෙන්ම නතර කළ නොහැකිද;

(ii) පාසල් අවට දුම්වැටි විකිණීම සම්පූර්ණයෙන්ම නතර කළ නොහැකිද;

(iii) දුම් වැටියක මිල දරාගත නොහැකි මට්ටමට වැඩි කිරීමට නොහැක්කේ මන්ද;

(iv) රසායනික පොහොර භාවිතයෙන් වකුගඩු රෝගය ඇති වීමේ ප්‍රවණතාවය වැඩි වන බැවින්, පොහොර පිළිබඳව දැඩි තීරණ ගත් රජය, දුම්වැටි සඳහා දැඩි පියවරක් නොගන්නේ මන්ද;

(v) එයට හේතුව බහු ජාතික සමාගම්වල බලපෑමද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

620/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි,

(i) නොමිලේ පවත්වන පාඨමාලා සංඛ්‍යාව කොපමණද; එම පාඨමාලා කවරේද;

(ii) මුදල් අයකර පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද; එම පාඨමාලා කවරේද;

(iii) ඉල්ලුම් කරන සුදුසුකම් ඇති සියලු සිසුන් පාඨමාලා සඳහා ඇතුලත්කර ගන්නේද;

(iv) පහසුකම් ප්‍රමාණවත් නොවන පාඨමාලා කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පහසුකම් වැඩිකළහොත් බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩිවන බව පිළිගන්නේද;

(ii) සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීම සඳහා පහසුකම් වැඩි කරනු ලබන දිනය කවරේද;

(iii) "මෘදු කුසලතාවයන්ගේ සංවර්ධන අවශ්‍යතාවය හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීම සඳහා කටයුතු කරමින් පවතී" යන්නෙන් අදහස් කරන භෞතික ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

624/'16

ගරු වමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාවේ, වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධූරයට පත් වීමෙන් පසුව මේ දක්වා සිදු කර ඇති විදේශ සංචාර කවරේද;

(ii) ඌව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාගේ නියෝගයෙන් මේ දක්වා විදේශ සංචාර සඳහා යවා ඇති නිලධාරින්ගේ නම් කවරේද;

(iii) උක්ත (i) සහ (ii) හි සඳහන් සංචාරවල අරමුණු සහ ඒ සඳහා වියදම් වූ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

630/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2001– 2004 දක්වා පැවති එක්සත් ජාතික පක්ෂ රජය විසින් දීර්ඝකාලීන බදු පදනම මත පෞද්ගලික සමාගම් හෝ පුද්ගලයින් වෙත ලබාදී ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොළඹ, වොක්ෂෝල් වීදියේ පිහිටි ගබඩා සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) බදු දී ඇති ගබඩාවේ නම, වර්ග අඩි ප්‍රමාණය, බදු දුන් මුදල සහ බදු දුන් සමාගම හෝ පුද්ගලයාගේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ගබඩා බදු දී ඇත්තේ අමාත්‍ය මණ්ඩල අනුමතියකට, විවෘත ටෙන්ඩර් පටිපාටියකට හෝ රජයේ තක්සේරුවකට යටත්වද;

(ii) එවැනි කොන්දේසි කිසිවක් නොමැතිව මෙම ගබඩා බදු දී ඇත්නම්, ඒවා නැවත රජයට පවරා ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

631/'16

ගරු තාරක බාලසූරිය මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ පළාත් මාර්ග කාපට් අතුරා සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කෑගල්ල මැතිවරණ කොට්ඨාසයේ, මාර්ග 12ක් සංවර්ධනය කිරීමට යෝජිතව තිබූ බවත්;

(ii) යෝජිත මාර්ග අතර වූ කෑගල්ල, නිල්වක්ක හරහා අන්දිරමඩ මාර්ගය (කි.මී. 6.9), උඩුගොඩ, කිරිපට්ටිය හන්දියෙන් හැරී ඕවිටිගමුව හරහා නිකපිටිය දක්වා ඇති මාර්ගය (කි.මී. 4.20), අඹවල, උඩුමාගම, පන්දෙනිය මාර්ගය (කි.මී. 2) යන මාර්ගවල වැඩ ආරම්භ කර ඇතත් වැඩ අවසන් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගවල වැඩ අවසන් කිරීමට කඩිනම් පියවර ගන්නේද;

(ii) නොඑසේ නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

633/'16

ගරු ජයන්ත සමරවීර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1948 පෙබරවාරි 04 දින සිට 2016 මාර්තු 24 දක්වා කාලය තුළ මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ පුද්ගලයින් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මරණීය දණ්ඩනයට හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ සිරකරුවන්ගේ නම, ලිපිනය හා එවැනි දඬුවමක් නියම කිරීමට එකී සිරකරුවන් සිදුකළ වරද කුමක්ද යන්න එක් එක් සිරකරුවා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලබා සිටි සිරකරුවන් සඳහා විශේෂ සමාවක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, විශේෂ සමාව ප්‍රදානය කරනු ලැබුවේ කවුරුන් විසින්; කවර දිනයකදී, කවර දඬුවමකට ලක්ව සිටි කවර සිරකරුවන්ටද යන්න වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

114/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රණවිරු සේවා අධිකාරියේ සේවය කරන ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2013 හා 2014 දී එම අධිකාරියේ ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් සැපයීමට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල ඇඳුම් ලබා දුන් ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය, කාන්තා සහ පිරිමි ලෙස කාණ්ඩගත කළ විට, එක් එක් කාණ්ඩයේ එක් අයෙකු වෙනුවෙන් නිල ඇඳුම් සඳහා දරනු ලැබූ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල ඇඳුම් සඳහා තෝරාගත් රෙදි තත්ත්වයෙන් බාල බවත්;

(ii) එම නිසා නිලධාරීන් එම ඇඳුම් ප්‍රතික්ෂේප කර ඇති බවත්;

(iii) අධිකාරියේ සභාපතිනිය අත්තනෝමතිකව කටයුතු කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) රණවිරු සේවා අධිකාරියේ නිල ඇඳුම් ගැටලුව විසඳීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?